| | |
|---|---|
| Liberté • Égalité • Fraternité<br>RÉPUBLIQUE FRANÇAISE<br>MINISTÈRE DE LA JUSTICE | 4<br>**අයිතීන් පිළිබඳ ප්‍රකාශනය**<br>**පොලිස් අත්අඩංගුවේ පසු වන අයකුට හිමි විය යුතු සහන**<br>**ත්‍රස්තවාදී ක්‍රියා**<br>**වගන්තිය (වගන්ති 63-1, 706-73 සහ 706-88 - අපරාධ විධිවිධාන පනත)** |

**පහත සඳහන් කරුණු ඔබ වෙත ලබා දිය යුතු වන්නේ ඔබ හට තේරුම් ගත හැකි භාෂාවකිනි.**

***<u>පොලිස් අත්අඩංගුවේ පසු වන සම්පූර්ණ කාලය තුළ තමාට මෙම ලේඛනය තමා සන්තකයේ තබා ගත හැක</u>***

තමා හට දන්වා සිටින්නේ තමා පොලිස් අත්අඩංගුවේ පසු වන්නේ අපරාධයක් හෝ ත්‍රස්ත ක්‍රියා යටතට ගැනෙන වරදක් සිදු කිරීම හෝ සිදු කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් සැක කළ හැකි විශ්වාස කටයුතු කරුණක් හෝ කරුණු කිහිපයක් තමාට එරෙහි ව ඇති නිසා ය.

පැය 24 ක කාලයක් පුරා දිවෙන පොලිස් අත්අඩංගුව අතරතුර මෙකී ක්‍රියා පිළිබඳ ව ඔබගෙන් ප්‍රශ්න කෙරෙනු ඇත.

ඔබ හට චෝදනා නගා ඇති වරදකාරී ක්‍රියාව සිදු කරන ලදැයි නිගමනය කර ඇති දිනය, ස්ථානය සහ ඊට අදාළ සීමා සම්බන්ධයෙන් ද පොලිස් අත්අඩංගුවට ගැනීම සාධාරණීකරණය කළ හැකි හේතු දැන ගැනීමට ඔබට අයිතියක් ඇත.

මෙකී කාල සීමාව අවසානයේ දී, මහජන පැමිණිලිකරු විසින් (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයා) විසින් තවත් අතිරේක පැය 24 ක කාල සීමාවකට පොලිස් අත්අඩංගුව දීර්ඝ කිරීමට තීරණය කළ හැක. එසේ කිරීමට අපහසු අවස්ථාවන් හි දී, අත්‍යවශ්‍ය වේ නම් වීඩියෝ දුරකථන සංවාද ජාල හරහා තමුන් ව මහේස්ත්‍රාත්වරයා වෙත පමුණුවනු ඇත.

විශේෂිත හේතු කාරණා මත හෝ විමර්ශනයේ අවශ්‍යතාව මත, එක් වාරයක් පැය 24 බැගින් වන අතිරේක දීර්ඝ කිරීම් 2 ක් සිදු කිරීමට තීරණය කිරීමේ හැකියාව සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ විනිසුරුට හෝ පරීක්ෂණය පවත්වනු ලබන මහේස්ත්‍රාත්වරයාට ඇත්තේය.

කෙසේ වෙතත්, පළමු පැය 48 තුළ විමර්ශනය බලාපොරොත්තු වූ ආකාරයට අවසන් කළ හැකි බවට ඒත්තු ගැන්වෙන්නේ නම්, මහජන පැමිණිලිකරු විසින් හෝ පරීක්ෂණය සිදු කරනු ලබන විනිසුරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ විනිසුරුට හෝ පරීක්ෂණය කරනු ලබන මහේස්ත්‍රාත්වරයා විසින් පැය 48 ක කාලයක් සඳහා බලපැවැත්වෙන, එක් වරක් පමණක් දීර්ඝ කළ හැකි පොලිස් රැඳවුම් නියෝගයක් තීරණය කිරීමේ හැකියාව ඇත.

විමර්ශනයෙන් හෙළිදරව් වන මූලික කරුණු මත හෝ පොලිස් අත්අඩංගුව ම මත, ප්‍රංශය තුළ හෝ විදේශයක දී සිදු විය හැකි ත්‍රස්තවාදී ක්‍රියාවක් සම්බන්ධයෙන් පවතින ඉතා දැඩි තර්ජනයක් නිසාවෙන් හෝ එවැන්නක් ජාත්‍යන්තර සහයෝගීතාව නිසා අත්‍යවශ්‍යයෙන් ම ඉල්ලා සිටින කාරණයක දී හෝ හේතුකොටගෙන දැනට ක්‍රියාත්මක රැඳවුම් නියෝගයක් මත එක් වරක් අළුත් කළ හැකි පැය 24 වන අතිරේක දිර්ඝ කිරීමක් සුවිශේෂී කරුණු මත සහ පරීක්ෂණය පවත්වන මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලබන නියෝගයක් මත හෝ මහජන පැමිණිලිකරු විසින් කරනු ලබන ඉල්ලීම මත සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ විනිසුරු විසින් අවසර ලබා දෙන ලද ලිඛිත සහ විස්තරාත්මක තීරණ මත ලබා දිය හැකි ය.

පොලිස් අත්අඩංගුව අවසානයේ මහජන පැමිණිලිකරු හෝ පරීක්ෂණය කරනු ලබන මහේස්ත්‍රාත්වරයාගේ තීරණය මත මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම හෝ මුදා හැරීම සිදු කළ හැක. ඔබගේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම පැය 72 කට වඩා වැඩි වන්නේ නම් මිස ඔබ අත්අඩංගුවේ පසුවන කාලය ඉක්ම ගොස් පැය 20 කට නොඅඩු කාලයක් තුළ දී ඔබ ව විනිසුරුවරයකු ඉදිරියට මුල් වරට පැමිණවිය යුතු වන්නේ ය.

**ඔබ හට තවදුරටත් දන්වා සිටින්නේ ඔබ හට ඇති අයිතීන් අතරේ:**

**යම් පුද්ගලයන් හට දැනුම් දීම**

ඔබ ව පොලිස් අත්අඩංගුවේ රඳවා ඇති බව දුරකථන මාර්ගයෙන් ඔබේ දෙමාපියන්ගෙන් එක් අයකුට හෝ එක් සහෝදරයකුට හෝ සහෝදරියකට හෝ ඔබේ භාරකරුට හෝ ඔබ ව රැකබලා ගන්නා කෙනෙකුට දන්වන මෙන් ඉල්ලීමක් කිරීමට ඔබට හැක.

ඊට අමතර ව ඔබට ඔබගේ සේවායෝජකයාට දැන්වීමට ද හැකියාව ඇත.

ඔබ විදේශීය ජාතිකයකු නම් තවදුරටත් ඔබට ඔබගේ රටේ තානාපති අංශ වෙත ඒ ආකාරයෙන් ම දැනුම් දීමේ හැකියාව

ඇත.

කෙසේ වෙතත් සිදු කරනු ලබන පරීක්ෂණ වල අවශ්‍යතාව සළකා බලා මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයාට) එකී ඉල්ලීම් වලට විරුද්ධ විය හැක.

නොවැලැක්විය හැකි තත්ත්වයන් යටතේ හැර ඔබගේ ඉල්ලීම සිදු කර උපරිම වශයෙන් පැය 3 ක කාලයක් තුළ ඉතා කඩිනමින් එකී ඉල්ලීම ඉටු කළ යුතු වේ.

ඔබගේ සමීපතමයන්ට දැනුම් දීමට ඔබ කළ ඉල්ලීමට සාධාරණයක් සිදු නොවී නම් සහ ඔබගේ රඳවා තබා ගැනීම පැය 96 කට අධික කාලයක් ඉක්මවා යා හැකි යැයි අනුමාන කළ හැකි අවස්ථාවක දී එකී 96 වැනි පැයට පසුව ආරම්භ වන ආකාරයට ඔබගේ ඉල්ලීම නැවත ඉදිරිපත් කිරීමට ඔබට හැකියාව ඇත. කෙසේ වෙතත් විමර්ශනයේ අවශ්‍යතා මත සලකා මෙම ඉල්ලීමට නැවතත් විරුද්ධ වීමට මහජන පැමිණිලිකරු හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයාට හැකියාව ඇත.

**වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කරවා ගැනීම**

අත්අඩංගුවේ පසුවන මුල් අවස්ථාවේ පටන් එකී ක්‍රියාමාර්ගයේ දීර්ඝ කිරීමක දී ද ඔබට වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කරවා ගැනීම සඳහා ඉල්ලීමක් කළ හැකි ය. අවසානයේ දී පනවනු ලබන එක් එක් අතිරේක දිර්ඝ කිරීම් අතරතුර වෛද්‍යවරයකු ලවා ඔබගේ ශරීරය පරීක්ෂා කරවා ගැනීම අනිවාර්ය වන අතර ඔබට නව වෛද්‍ය පරීක්ෂණ ලබා ගැනීමට ඇති අයිතිය මෙහි දී අදහස් කරනු ලැබේ.

**ප්‍රකාශ ලබා දීම, ප්‍රශ්න කිරීම් වලට උත්තර දීම හෝ නිහඬ ව සිටීම**

ඔබගේ අනන්‍යතාව ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව වන පරීක්ෂණ අතරතුර ඔබට ඇති අයිතීන් නම්:
- ප්‍රකාශ සිදු කිරීම.
- ඔබගෙන් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම.
- හෝ නිහඬ ව සිටීම සිදු කළ හැක.

**නීතිඥවරයකු සමග සාකච්ඡා කිරීම**

**<u>- නීතිඥවරයකු තෝරා ගැනීම</u>**

අත්අඩංගුවට පත් මුල් අවස්ථාවේ දී ම ඔබ විසින් තෝරා පත්කර ගන්නා ලද නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීමට ඉල්ලීමක් කිරීමට ඔබට හැකියාව ඇත. ඔබ හට නීතිඥවරයකු පත් කර ගැනීමට හැකියාවක් නොමැත්තේ නම් හෝ තෝරා ගත් නීතිඥවරයා සම්බන්ධ කරගත නොහැකි නම් පත් කළ නීතිඥයකු සමග සාකච්ඡා කිරීමට ඉල්ලීමක් කිරීමට ඔබට හැකි ය.

ඔබ විසින් දැනුම් දෙන ලද තැනැත්තකු විසින් ද ඔබගේ නීතිඥවරයා ව, සමහර විට, පත් කර තිබිය හැක. එවැනි අවස්ථාවක දී ඔබ විසින් එකී නීතිඥවරයාගේ පත් කිරීම අනුමත කළ යුතු වේ.

**<u>- නීතිඥවරයාගේ සහාය</u>**

පත් කරන ලද නිතිඥවරයාට කළ හැකි දෑ නම්:
- ඔබ සමග විනාඩි 30 ක කාලය පුරාවට සාකච්ඡා සිදු කළ හැක. දීර්ඝ කිරීමක දී, එකී දීර්ඝ කිරීම ආරම්භයේ දී ඔබගේ නීතිඥවරයා සමග සාකච්ඡා කිරීමට අළුතින් ඉල්ලීමක් කිරීමට ඔබට හැකි ය.
- තව ද ඔබ විසින් ඉල්ලීමක් සිදු කරන්නේ නම්, ඔබ සම්බන්ධයෙන් වන විභාග කිරීම් සහ ප්‍රශ්න කිරීම් වල දී ද ඔහුගේ සහාය ලබා ගත හැක.

**<u>- මැදිහත් වීමට ලබා දී ඇති නිශ්චිත කාලය</u>**

-කඩිනම් විමර්ශනයක අවශ්‍යතාව සැලකිල්ලට ගෙන ඔබගේ පරීක්ෂණය ආරම්භ කිරීම සඳහා ඔබගේ නීතිඥවරයාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් ලබා දෙන ලද පැය 2 ක කාලය අවසන් වන තුරු නොසිටීමට ලිඛිත ව ගනු ලබන තීරණය මහජන පැමිණිලිකරු විසින් සිදු කළ හැක.
-සුවිශේෂී කරුණු සැලකිල්ලට ගනිමින් පුරා පැය 72 ක කාලයක් සඳහා වන උපරිමයකට යටත් ව නීතිඥවරයකුගේ මැදිහත් වීම ද ඒ ආකාරයෙන් කල් දැමීමට හැකියාව ඇත.

**භාෂා පරිවර්තකයකුගේ සහාය ලබා ගැනීම**

ඔබට ප්‍රංශ භාෂාව කථා කළ නොහැකි නම් හෝ තේරුම්ගත නොහැකි නම් ඔබ හට කිසිදු ගාස්තුවක් නොමැති ව, ඔබගේ ප්‍රශ්න කිරීම අතරතුර සහ ඔබගේ නීතිඥවරයා සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාෂා පරිවර්තකයකුගේ සහාය පැතීමට අයිතිය ඇත.

**පොලිස් අත්අඩංගුව අවසන් කරන මෙන් ඉල්ලීමක් කිරීමට ඇති අයිතිය**

මහේස්ත්‍රාත්වරයා විසින් රැඳවුම් නියෝගයක් දීර්ඝ කිරීමට තීන්දු කළ විට එකී නියෝගය අනුව එකී අත්අඩංගුවේ තැබීම දීර්ඝ නොකරන ලෙස, මහජන පැමිණිලිකරුගෙන්, පරීක්ෂණය පවත්වනු ලබන මහේස්ත්‍රාත්වරයාගෙන් හෝ සිවිල්

අයිතීන් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ විනිසුරුගෙන් ඉල්ලීමක් කිරීමට ඔබට හැකියාවක් ඇත.

**ඔබගේ නඩු ගොනුවේ ඇති ඇතැම් ලේඛන වලට ඇති ප්‍රවේශය**

ඔබගේ ඉල්ලීම මත හෝ ඔබගේ නීතිඥවරයාගේ ඉල්ලීම මත, වෙනත් අවස්ථාවක දී ඔබගේ අත්අඩංගුවේ රඳවා තබා ගැනීම දීර්ඝ කිරීමකට පෙර පහත දෑ පිරික්සීමට ඔබට හැක:

- ඔබගේ අත්අඩංගුවට ගැනීම දැනුම් දීමට අදාළ කාර්යය සටහන්
- ඔබව පරීක්ෂා කරන ලද වෛද්‍යවරයා විසින් සපයන ලද වාර්තාව හෝ වාර්තා
- ඔබගේ ප්‍රශ්න කිරීම් හා සම්බන්ධ කාර්යය සටහන්.